නුවරඑළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ගනුදෙනු මෙහෙයුම් සහ කාර්ය සාධනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව අගෝස්තු 09 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 ගනුදෙනු, මෙහෙයුම් හා කාර්ය සාධනය පිළිබඳව අදහස් දැක්වීම.
---------------------------------------------------------------------

1.2.1 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.
---------------------------------------------------

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 218 | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂාකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ). ශ්‍රී ලංකා ජනරජයේ | |
| (i)මුදල් රෙගුලාසි 189 | රු.177,040ක් වටිනා චෙක්පත් 06ක් අගරු වී මාස 03 සිට 34 දක්වා කාලයක් ගත වුවද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ii)මුදල් රෙගුලාසි 371 | 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අතර කාලය තුළ අවස්ථා 45 කදී ලබාදී මේ දක්වා නොපියවන ලද රු.5,193,262ක හා 2015 වර්ෂය තුළ අවස්ථා 20 කදී ලබාදී නොපියවන ලද රු.13,842,229ක් වශයෙන් එකතුව රු.19,035,491ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 02 ඉක්මවූ අවස්ථා 49කට අදාළ රු.1,557,401ක තැන්පතු නියාදනය කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 756 | වර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පවත්වා නොතිබුණි. |

1.3 ආදායම් පරිපාලනය

1.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2015.12.31 දිනට හිඟ

| ආදායම් විෂය | 2015.01.01 දිනට හිඟය | 2015 වර්ෂයේ බිල්කිරීම් | අයකළ යුතු මුළු මුදල | වර්ෂයේ බිල්කිරීම් වලින් | 2015.01.01 දිනට පැවති හිඟයෙන් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 4,382,268 | 4,122,637 | 8,504,905 | 2,511,058 | 2,811,467 | 3,182,380 |
| බදු කුලී | 870,873 | 5,200,994 | 6,071,867 | 4,790,906 | 466,019 | 814,942 |
| බලපත්‍ර ගාස්තු | - | 3,991,174 | 3,991,174 | 3,991,174 | - | - |
| ජල ගාස්තු | 1,388,171 | 2,178,026 | 3,566,197 | 1,223,916 | 996,411 | 1,345,870 |

1.3.2 වරිපනම් බදු

2015 දෙසැම්බර් 31 දිනට රු.3,182,380ක හිඟ වරිපනම් බදු පැවතියද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 32 සිට 42 දක්වා ඇති විධිවිධානයන් අනුව කටයුතු කර හිඟ මුදල් අයකරගෙන නොතිබුණි.

1.3.3 කුලී ආදායම්

කඩ කාමර 21කට අදාළව මාස 04 සිට මාස 28 දක්වා කාලයක් කුලී මුදල් හිඟව පවතින නමුත් ඒ සම්බන්ධයෙන් ගිවිසුම්වල 07වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

1.3.4 බලපත්‍ර ගාස්තු

වෙළඳ බලපත්‍ර සහ කර්මාන්ත පිළිබඳ බදු, මුදල් පදනම මත ගිණුම් තබා තිබුණු අතර ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 අනුව බලපත්‍ර ලබාගත යුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ලේඛනගතකර බිල් කිරීමෙන් පසුව ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 ජල ගාස්තු

සභාව විසින් ජල පාරිභෝගිකයින් සමඟ එළඹ ඇති ගිවිසුම් ප්‍රකාරව ගාස්තු නොගෙවන අවස්ථාවලදී ජලය විසන්ධිකර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2 මෙහෙයුම් සමාලෝචනය

2.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (xi) වගන්තිය සහ ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති අංක CP/RD/02/10 දරන චක්‍රලේඛයේ 3:5 වගන්තියට පටහැනි ලෙස 2015 අප්‍රේල් 30 දින මහා සභාවේ අංක 03:05 දරන සභා තීරණය මගින් අක්කර 01 රූඩ් 02යි පර්චස් 38.6ක් වූ ක්‍රිස්ලස් ෆාම් නම් ඉඩම මාසික කුලී පදනම මත කොටස් 37කට අනුබෙදුම් කර ගිවිසුම් යටතේ ලබාදී තිබුණි. මෙහිදී ඉඩම් ලාභින්

තෝරාගැනීමේ පදනම විගණනයට පැහැදිලි නොකළ අතර සභාවේ මන්ත්‍රීවරුන් 08 දෙනෙකුට සහ නිලධාරීන් 21 දෙනෙකු සඳහා ගිවිසුම් මඟින් ඉඩම් කොටස් බදුදී තිබුණි.

(ආ). 2012 වර්ෂයේදී විමධ්‍යගත අරමුදලින් මිලදීගත් රු.60,000ක් වටිනා සාස්පාන් කට්ටල 04ක් 2015 ඔක්තෝබර් 15 දින වන විටද අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදී නොතිබුණි.

(ඇ). 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 20 දින දක්වා ඉදිරිපත් නොකළ අතර, 2014 දෙසැම්බර් 31 පැවති රු.67,129,547ක අවිනිශ්චිත ගිණුම් හර ශේෂය නිරවුල් කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

2.2 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

සභාව පවත්වගෙන ගිය ගොඩනැගිල්ල 2015 මැයි මාසයේ කඩා ඉවත්කිරීමට නියමිතව තිබියදී, 2014 අප්‍රේල් සිට 2015 අප්‍රේල් දක්වා කාලය තුළ පෙරටු කාර්යාලයක් ඉදිකිරීම සඳහා රු.950,052ක වියදමක් දරා තිබුණි. නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පැරණි ගොඩනැගිල්ල 2015 මැයි මාසයේදී කඩා ඉවත්කිරීම හේතුවෙන් මෙම වියදම නිෂ්කාර්ය වී තිබුණි.

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

2.3.1 නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම

---------------------------------------------------

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ) රු.75,000,000ක පිරිවැය ඇස්තමේන්තුවකින් යුත් මෙම ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ප්‍රකාරව අරමුදල් ලැබෙන බව නිශ්චිතව තහවුරුකර ගැනීමකින් තොරව, දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගැනීමේ බලාපොරොත්තුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකර 2015 මැයි 15 දින ගිවිසුම් අත්සන්කර වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් ලෙස රු.11,000,000ක් ගෙවා තිබුණි. එහෙත් අපේක්ෂිත ණය මුදල ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් මේ වන විට වසරකට ආසන්න කාලයක් ව්‍යාපෘතියේ කටයුතු නවතා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2 (ආ) සහ (ඇ) වගන්ති අනුව ව්‍යාපෘතියක් සඳහා ලංසු ආරාධනා කිරීමට පෙර පිරිවිතර ඇතුලු ලංසු ලේඛණ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කර සමාලෝචනය කිරීමෙන් පසු අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ලංසුකරුවන් තෝරාගැනීමේදී පිරිවිතරයන් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ සමාන දේශගුණික තත්ත්වය තුළ පසුගිය වසරේ මිලියන 100කට වැඩි වැඩ සාර්ථකව නිමකළ කොන්ත්‍රාත්කරුවකු විය යුතුය යන කාරණය, 2015 මාර්තු 3 දින සභා තීරණයක් ලෙස ගෙන තිබුණු අතර, එම සභා තීරණය ව්‍යාපෘතියේ ලංසුකරු තෝරාගැනීමේ තීරණාත්මක පිරිවිතරයක් වී තිබුණි. එහෙත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (11) ඡේදය අනුව එම පිරිවිතරයන් ස්වභාවයෙන්ම උත්පාදනය වූ බවටත්, සමාන සහ සාධාරණ මට්ටමකින් තරඟකාරීබව ප්‍රවර්ධනය කළ හැකි බවටත්, සහතිකවීම පිණිස තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසු කැඳවීමට පෙර සමාලෝචනය කර සහතික කර නොතිබුණි.

(ඈ) එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 අනුව ප්‍රසම්පාදන අරමුණු සාක්ශාත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට වඩා පටු ආකාරයට පිරිවිතර විස්තර නොකළ යුතු වුවද, චේතනාන්විතව පිරිවිතර පටුකර තිබුණි. ඉහත තත්ත්වයන් තුළ

පිරිවිතරයන් සීමාකර ලංසු ඇගයීම හේතුවෙන් අවම වශයෙන් රු.8,426,532ක අලාභයක් සභාවට සිදුව තිබුණි.

(ඉ) ව්‍යාපෘතියේ උපදේශකවරයාට 2015 මාර්තු 25 දින රු.500,000ක මුදලක් ගෙවූ තිබුණද, ඔහු සමඟ ගිවිසුමකට බැඳී නොතිබුණි.

2.3.2 <u>නානුඔය ජල යෝජනා ක්‍රමය</u>

නානුඔය ජල යෝජනා ක්‍රමය සඳහා මිලි මීටර් 3:2 ඝණකමින් යුත් විශ්කම්භය අඟල් 02 ජී.අයි බට 70ක් මිලදී ගැනීමේදී, වෙළඳපොළ පැවති මිල ගණන්වලට වැඩියෙන් එක් බටයක් සඳහා රු.1,350ක් බැගින් රු.94,500ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.3.3. <u>ටොප්පාස් මාර්ගය සංවර්ධනය කිරීම</u>

නුවරඑළිය ටොප්පාස් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව රු.949,984ක බිල්පත්‍රය තුල රු.5,000ක් වටිනා නාම පුවරුව ක්ෂේත්‍රයේ සවිකර නොතිබූ බව 2015 ජනවාරි 29 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අණාවරණය විය.

2.4 ව්‍යාපෘති ප්‍රමාදකිරීම්

---------------------

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ සවිකිරීම සඳහා "කසළ දැමීම තහනම් " , "වාහන නැවැත්වීම තහනම් " ලෙස නාම පුවරු සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදීගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.705,510ක් ගෙවා තිබුණි. මෙලෙස නාම පුවරු සවිකිරීම සඳහා මිලදීගත් ද්‍රව්‍ය ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරීවරයා වෙත නිකුත් කර අඩක් නිමවා තිබූ නාමපුවරු 51ක් හා ජීඅයි බොක්ස් බාර් 35ක් 2015 නොවැම්බර් 24 වන විට කාර්යාල පරිශ්‍රයේ කන්ටේනරයක් තුළ ගොඩගසා තිබුණි.

2.5 වාහන පාලනය

-----------------

i. 2012 වර්ෂයේදී මිලදීගෙන තිබුණු අංක CPYV – 5082 දරන ත්‍රී රෝද රථයේ ඉන්ධන දහනය 2013 වසරේ අගෝස්තු මාසයේ පරීක්ෂණ අවස්ථාවේදී ඉන්ධන ලීටරයකට කි.මී.27ක් ව තිබුණු නමුත් 2014 අගෝස්තු මාසයේ පරීක්ෂණ අවස්ථාව වන විට ඉන්ධන ලීටරයකට කි.මී.18 දක්වා සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි.

   මේ සම්බන්ධයෙන් සොයාබලා කටයුතු කර නොතිබුණු අතර 2014 අගෝස්තු මාසයෙන් පසුව ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂාවක්ද සිදුකර නොතිබුණි.

ii. අංක CPPB- 9115 කැබ් රථයේ හා CPJF – 7441 ට්‍රැක්ටරයේ ආදායම් බලපත්‍ර පිළිවෙලින් 2015 ජූනි හා අගෝස්තු මාසවල අවසන්වී තිබුණද, ඉදිරි වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට 2015 නොවැම්බර් 27 වැනි දින වන විටත් කටයුතු කර නොතිබුණි.

3. යහපාලනය හා ගිණුම්කටයුතු භාවය

----------------------------------------

3.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

සභාවේ මිලදීගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

3.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ණයගැති /ණයහිමි පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය